# බටහිර සම්භාව්‍ය සංස්කෘති හා ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයන අංශය

මහාචාර්ය චර්ලි විජේසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඊෂා ගමලත්

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය නමින් එවකට නම් කරන ලද කැලණිය විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි සංස්කෘතිය නමැති පාඨමාලාව ප්‍රථමයෙන් ම ආරම්භ වූයේ වර්ෂ 1976 දී ය. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයට අනුබද්ධ ව ක්‍රිස්තියානි සංස්කෘතිය පාඨමාලාව ආරම්භ වූ නිසා එහි ප්‍රථම අංශාධිපතිවරයා වූයේ එවකට පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශාධිපති තනතුර හෙබ වූ මහාචාර්ය ඩබ්ලිව්.එස්. කරුණාරත්න මහතා ය. මෙකල මණ්ඩපාධිපති පූජ්‍ය ආචාර්ය ඩී. ජේ. කොතලාවල මහතා විසින් දරන ලදී.

1976 මැයි මස 18 වෙනිදා ආරම්භ වූ අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගත් උපාධිලාභීන් අතරින් ශිෂ්‍යාවන් තිදෙනෙක් සහ ගරු සහෝදරයකුමෙක් ක්‍රිස්තියානි සංස්කෘතිය පාඨමාලාව හැදෑරීමට මුලින් ම ඉදිරිපත් වූහ. එහි දී ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රමාණවත් නොවුණ පාඨමාලා සඳහා දෙවන වරට ද (2nd intake) විද්‍යාර්ථීන් ඇතුළත් කර ගැනීමෙන් පසු ගරු ස්වාමීන් වහන්සේලා හයනමක් සහ ශිෂ්‍යශිෂ්‍යාවන් තිදෙනෙක් ක්‍රිස්තියානි සංස්කෘතිය පාඨමාලාව හැදෑරීමට ඉදිරිපත් වූහ. මේ අනුව ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයෙන් පසු සාමාන්‍යවේදී උපාධි පාඨමාලාවට අමතර ව සුදුසුකම් ලැබූ විද්‍යාර්ථීන් සඳහා විශේෂවේදී උපාධි පාඨමාලාව ද 1977 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. ප්‍රථමයෙන් ශිෂ්‍යාවන් දෙදෙනෙක් සහ ගරු ස්වාමීන්වහන්සේලා දෙනමක් විශේෂවේදී උපාධිය සඳහා ක්‍රිස්තියානි සංස්කෘතිය පාඨමාලාව යටතේ ලියාපදිංචි වූහ.

ආරම්භයේ දී බාහිර දේශකවරු මගින් මෙම අධ්‍යයන කටයුතු ආරම්භ කළ අතර, ගරු පෙලෙස්ටීන් ප්‍රනාන්දු පියතුමා සහ ගරු